# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## ප්‍රාසංගික කලාවේදී (ගෞරව) උපාධි දෙවන වසර පරීක්ෂණය - 2019/2020

## නර්තන හා නාට්‍ය කලා පීඨය

## <u>ශ්‍රී ලාංකේය නර්තන කලා ඉතිහාසය සහ සිද්ධාන්ත</u>

## <u>DDCT 21013</u>

කාලය :- පැ 03

❖ සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.

---

- ❖ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් (02) සහ ප්‍රශ්න අටකින් (08) සමන්විත ය.
- ❖ <u>එක් කොටසකින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් හෝ තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක්</u> පිළිතුරු සපයන්න.
- ❖ එක් එක් කොටස සඳහා පිළිතුරු සැපයීමේදී පිළිතුරු ලියන පොත් වෙන වෙනම භාවිත කළ යුතුය.
- ❖ සෑම ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කරන්න.
- ❖ සියලුම ප්‍රශ්න සඳහා සමාන ලකුණු ලැබේ.

---

### <u>I කොටස</u>

01. ශ්‍රී ලංකාවේ අනුරාධපුර හා පොළොන්නරු යුගයන්හි රාජ්‍ය පාලන සමයේ විවිධ රජවරු විසින් නර්තන කලාවේ ප්‍රවර්ධනයට කටයුතු කල ආකාරය පිළිබඳව උදාහරණ සහිතව විමසීමක් කරන්න.

02. "භූගෝලීය කලාප මත පදනම්ව ශ්‍රී ලාංකේය නර්තනයේ අන්තර්වර්තී සංස්කෘතික විශේෂතා හඳුනාගත හැකිය." ඇදහිලි විශ්වාස ඇසුරින් සාකච්ඡා කරන්න.

03. වර්තමාන නර්තන අධ්‍යාපනය, පාසැල් පද්ධතියේ සිට විශ්වවිද්‍යාලය දක්වා විකාශය වූ අයුරු පිළිබඳව විමසීමක් කරන්න.

04. "20 සියවසෙන් පසු නර්තන කලාව ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යට විතැන්වී ඇත." උදාහරණ සහිතව විස්තර කරන්න.

### <u>II කොටස</u>

05. නර්තන කලා සාහිත්‍යය සහ නර්තන ප්‍රබන්ධ සාහිත්‍යය පිළිබඳ නිදසුන් සහිතව විමර්ශනයක් කරන්න.

06. ශාන්තිකර්මයන්හි අන්තර්ගත සන්නිවේදනාත්මක ලක්ෂණ ආතුර පක්ෂය කෙරෙහි කවර බලපෑමක් ඇති කරයිද? ඔබගේ අදහස් දක්වන්න.

07. දේශිය නර්තන සම්ප්‍රදායයන් ත්‍රිත්වයේම ආධුනික නර්තන ශිල්පියා සමාජගත කරන කලඑළි මංගල්‍යය චාරිත්‍ර තුළින් පිළිබිඹුවන සාරධර්ම පිළිබඳ විමසීමක් කරන්න.

08. "දේශීය නර්තනය තදනුබද්ධ ගායනය, වාදනය, නර්තනය ගතිලක්ෂණ විධාරණය උදෙසා මකුළොළුව තාල සංස්කරණය ප්‍රමාණවත් නොවේ." තනතිතේ තාල ප්‍රභේද ඇසුරින් විමසන්න.

......................

2023.01.31